# දෙමළ ජාතිවාදය හා බෙදුම්වාදය නැවි නැගීම

මෙරට දෙමළ ප්‍රශ්නය කුමක්ද යන්න තවමත් සිංහලයන් ද තේරුම්ගන්නේ බටහිරයන්ගේ සුසමාදර්ශයක් මත පදනම් වීමෙනි. ඒ පිළිබඳව ද  මූලිකව දොස් පැවරිය යුත්තේ අධ්‍යාපන ක්‍රමයට ය. එහෙත් සිංහලයන් බටහිරයන් කියන දෙය හැරෙන්නට වෙනත් අයකු පළමුවෙන් කියන දෙයක් පිළිගැනීමට ඇති අකමැත්ත ද මෙහි දී බලපායි. සිංහලයන් දැනුම නිර්මාණය බටහිරයන්ට පමණක් භාර දී සිටිනතාක් රටට සිදුවන්නේ අයහපතකි. මෙහි දී සුසමාදර්ශයක් යනුවෙන් අදහස් කෙරෙන්නේ යම් යම් ප්‍රවාද, සංකල්ප ආදිය නිර්මාණය කිරීමේ දී යොදා ගැනෙන පසුබිමක් බව කිව යුතු ය. සුසමාදර්ශය යනු පැරඩයිමය යන්නෙහි සිංහල පරිවර්තනයයි. අප යොදාගන්නා අර්ථයෙන් චින්තනය යන්න තෝට් යන ඉංගිරිසි වදනෙහි පරිවර්තනයක් නොව සුසමාදර්ශයට වඩා ගැඹුරු සංකල්පයකි. චින්තනයක සුසමාදර්ශ කිහිපයක් තිබිය හැකි බව මෙහි දී සඳහන් කළ යුතු ය. දෙමළ ප්‍රශ්නය ගැන ගෙතී ඇති කතා දෙකක් වෙයි. එකක් බටහිර ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි සුසමාදර්ශයක් වටා ගෙතී ඇත. අනෙක සිංහල බෞද්ධ චින්තනයෙහි සුසමාදර්ශයක් වටා ගෙතී ඇත. සිංහලයෝ ඉතා වැඩි පිරිසක් තවමත් පළමු කතාව විශ්වාස කරති. බලය බෙදීම යන්න ප්‍රශ්නයට විසඳුමක් ලෙස ඉදිරිපත්වන්නේ ඒ පළමු කතාවෙහි ය. ඒ පළමු කතාවෙහි ඊනියා අසාධාරණකම්, චෙල්වනායගම්ගේ ව්‍යාජ අහිංසා සටන්, ආණ්ඩුව ඒ ඊනියා අහිංසා සටන් හිංසාවෙන් මැඩලීම්, ඒ හේතුවෙන් දෙමළ ජනයා ප්‍රචණ්ඩත්වයට තල්ලුවීම්, මෙරට අවුරුදු දහස් ගණනක දෙමළ ඉතිහාසයක්, ඊනියා නිජභූමි,  ආදිය වෙයි. එයට අමතරව මෑතක් වන තුරු කොටි සංවිධානය අනභිබවනීය හා ප්‍රභාකරන් ඉහළම ගණයේ යුද්ධ විශේෂඥයකු යන අතුරු කතා ද තිබුණි. ඒ අතුරු කතා දැන් නැතිවුවත් දෙමළ ප්‍රශ්නය දැන් පිටරටට පැටවී ඇත යන්න හා ඒ කෙදිනකවත් පරාජය කළ නොහැකි ය යන්න අළුතින් එකතු වී ඇත. දෙමළ ජනයාට වී ඇති අසාධාරණකම් නිසා සන්ධීය හෝ සහසන්ධීය හෝ රාජ්‍යයක් කරා අවසානයේ දී තල්ලු කරන ඊනියා නිජභූමිවලට බලය බෙදිය යුතු ය යන දේශද්‍රෝහී මෝඩ අතාර්කික නිගමනය බිහි වී ඇත්තේ මේ කතාවෙහි එක් අවසානයක් ලෙස ය. මේ කතාව තවදුරටත් විශ්ලේෂණය කර බලය බෙදීමට විරුද්ධ බලවේගය ශක්තිමත් කළ යුතුව ඇතත් මේ සතියේ අපට ඒ කතාවෙහි වෙනත් පැත්තක් ගැන අවධාරණය කිරීමට සිදු වී ඇත.

ඒ වෙනත් පැත්ත බටහිරයන්ගේ සුසමාදර්ශය මත පදනම් වූ කතාවෙන් (ගුරුත්වාකර්ෂණය ද ඇතුළු සෑම විද්‍යා ප්‍රවාදයක් ම කතාවකි. ඒ පිළිබඳ වැඩිදුර කරුණු විද්‍යා කතන්දර පොත කියවීමෙන් දැනගත හැකි ය) කිසිසේත්ම තේරුම් ගත නො හැකි ය. එයට හේතුව ඒ කතාවෙහි බටහිරයන්ගේ භූමිකාව ගැන කිසිවක් සඳහන් නො වීම ය. ප්‍රභාකරන්ගේ පරාජයෙන් පසු සිදුවිය හැකි දේ අපි කලින් සඳහන් කෙරුවෙමු. ඒ සියල්ල දැන් දැන් සත්‍ය වෙමින් පවතින්නේ සිංහල බෞද්ධ සුසමාදර්ශයක ගෙතුණු කතාව තහවුරු කරමිනි. මේ සියල්ල ඔස්සේ බටහිරයන්ගේ කුහකවත ද හෙළිවෙයි. පසුගිය දා එක්සත් ජාතීන්ගේ සංවිධානයෙහි ලංකාවට විරුද්ධ ව බ්‍රිතානිය සමග එකතු වූ ප්‍රධාන රට වූයේ ප්‍රංශයයි. එරට ජනාධිපති හා වෙනත් අය ගිය සතියේ මුස්ලිම් කාන්තාවන් පර්දාව ඇඳීමට විරුද්ධ වූහ. ඔවුන් එසේ විරුද්ධ වූයේ කාන්තා නිදහසක් වෙනුවෙනි. එහෙත් ඒ කාන්තා නිදහස යන්න බටහිර සංකල්පයක් බවත් කෙප්පයක් බවත් ඔවුහු අමතක කරති. බටහිර කාන්තා නිදහස යනු අවසාන විග්‍රහයෙහි දී බටහිර හැහැණුන්ට බටහිර පිරිමින් සේ සිතීමට බල කෙරෙන උප්පරවැට්ටියක් බව බටහිර ගැහැණුන්ට තවම තේරුම්ගැනීමට නො හැකි ය. මුස්ලිම්වරුන් පර්දාව ගැන තීරණයක් ගන්නා තෙක් බලා නොසිට ඔවුන් මත බටහිර සංකල්ප පැටවීම බටහිර මානව අයිතිවාසිකම්වලට ප්‍රශ්නයක් නොවනවා විය හැකි ය. බ්‍රිතානිය ඇතුළු අනෙක් බටහිර රටවල් ද මුස්ලිමුන් සම්බන්ධයෙන් ක්‍රියාකරන්නේ එපරිදි ය. එසේ වුවත් බටහිරයෝ ලංකාවේ ඊනියා අභ්‍යන්තර අවතැන්වූවන්ගේ කඳවුරු ගැන මහත් වේදනාවෙන් කිඹුල් කඳුලු හෙළති. ලක්ෂ දෙකක් හෝ වැඩි ගණනක් සිටින මේ ඇතැම් කඳවුරක තත්වය තරුපහේ හෝටලයක මෙන් නොවනු ඇත. එහෙත් ඒ කඳවුරු හිට්ලර්ගේ කඳවුරු සමග සංසන්දනය කිරීමෙන් පෙන්නුම් කෙරෙන්නේ බටහිරයන්ගේ අනුග්‍රහය ලබන දෙමළ ජාතිවාදීන්ගේ බංකොළොත්කම පමණකි. බ්‍රිතානියට, ප්‍රංශයට හා අනෙක් බටහිර රටවලට ඊනියා මානව දයාවක් ඇත්නම් කළ යුත්තේ එවැනි කඳවුරක තත්වය ඉහළට දැමීම සඳහා රජයට ආධාර කිරීම මිස ලංඩනයේ සිටින දෙමළ ජනයාට පෙළපාලි යෑම සඳහා පසුබිම සකස්කර දීම නො වෙයි. මේ කඳවුරුවල සිටින ජනයා ඉක්මනින් ඉන් පිටකිරීම ද නොකළ හැකි ය. ඒ කඳවුරුවල ද කොටි සිටිති. ඔවුන් සොයාගත යුතු ය. අනෙක් අතට භූමියෙන් බිම්බෝම්බ ඉවත්කළ යුතුව ඇත. ඒ කිසිවක් නොකර සියල්ලන් තොග ගණනේ පිටකිරීම යනු කොටින් යම් පිරිසකට නිදහස ලබා දීමත් ඔවුන්ට නැවතත් බිම්බෝම්බ වැළලීමට අවස්ථාව ලබාදීමත් ය. බටහිරයන්ට අද එක් පැත්තකින් අවශ්‍ය වන්නේ ද එයම ය. අනෙක් පැත්තෙන් ඔවුන්ට අවශ්‍ය

© Prof. Nalin De Silva

බටහිර සිටින දෙමළ ජනයා සිංහලත්වයට එරෙහිව මෙහෙයවීම ය. ලංඩනයේ පෙළපාලි යෑමට දෙමළ ජනයාට ඉඩ සලසන්නේත් ලංඩනයේ ජීවත්වන කෝටි කෙල්ලන්ට තමන් කොටින් බව ප්‍රසිද්ධියේ ප්‍රකාශකිරීමට අවස්ථාව ලබා දෙන්නේත් මේ අවශ්‍යතාව හේතුවෙනි. කොටින් තමන් තහනම් සංවිධානයක සාමාජිකයන් බව ප්‍රසිද්ධියේ ප්‍රකාශකරන්නේ ඒ තහනම නාමමාත්‍රික වුවක් බව පැහැදිලි කරමිනි.

පසුගිය දා එක් පශ්චාත්නූතන පඬියකු කියා තිබුණේ ප්‍රභාකරන් මියගියේ (ඔහු මියගියා නොව මැරුම් කෑවේ ය. හමුදාව ඔහු මරාදැමීම ගැන අපි ආඩම්බර වෙමු.) දෙමළ බෙදුම්වාදය පිටරටට පටවා බව ය. එංගලන්තයේ ජීවත්වන, චන්ද්‍රිකාගේ රූපවාහිනී අධ්‍යක්‍ෂකවරයකු වූ තවත් පඬියකු කියා තිබුණේ දෙමළ ප්‍රශ්නය කිසිදා නිම නොවන අරගලයක් බව ය. පළමු පඬියා ප්‍රභාකරන්ට මිය යෑමෙන් පසුව ද, තව තවත් දක්‍ෂකම් ආරෝපණය කිරීමට උත්සාහ කරයි. දෙවැනි පඬියා සිංහලයන්ට කිසි දිනෙක දෙමළ ජාතිවාදය හා බෙදුම්වාදය පරාජය කිරීමට නොහැකි බව කියයි. ඔවුන්ට  තම සුසමාදර්ශයෙන් දෙමළ ජාතිවාදය පිටරට ගියේ කෙසේ ද යන්න තේරුම්ගත නො හැකි ය. එහෙත් සිංහල බෞද්ධ චින්තනයෙහි සුසමාදර්ශයකට ඒ එතරම් කරුණක් නො වේ. මේ අතර කොටින්ගේ නව නායකයා වීමට හොරහල් අහුලන පද්මනාදන් නමැති ජාත්‍යන්තර අපරාධකාරයා ජාතීන් අතර විහිදුනු තාවකාලික ඊළාම් ආණ්ඩුවක් පිහිටුවීමට උත්සාහ කරයි. ඉතා පැහැදිලිව ම බ්‍රිතානිය, ප්‍රංශය ආදී රටවල් සිංහලත්වයට එරෙහි සටන අත්හැර නැත. අපට එයට මුහුණ දීම අසීරු කරුණක් නොවන්නේ සිදුවන්නේ කුමක්දැයි අප දන්නා බැවිනි.

ඒ දැනගැනීම සඳහා සිංහල බෞද්ධ චින්තනයෙහි සුසමාදර්ශයක දෙමළ ජාතිවාදය පිළිබඳ ගෙතුණු කතාව සැකෙවින් සඳහන් කරමු. බ්‍රිතානියෝ (අප නමෝ විත්තියෙන් ම පටන් ගන්නේ බටහිරයන්ගෙනි) ලන්දේසීන් විසින් තම දුම්කොළ වගාවට මෙරටට ගෙන්වනු ලැබූ වෙල්ලාලයන් සිංහලත්වයට විරුද්ධව යොදාගත්හ. එහි දී වෙල්ලාලයන්ට වරප්‍රසාද හා තනතුරු ලබාදුන්නේ මෙරට සිංහලත්වයට හිමි තැන අහිමි කරමිනි. කෝල්බෲක්ගේ තක්කඩි යෝජනාවල සිට ඩොනමෝර් යෝජනා දක්වා මෙරට සිදුවූයේ සිංහලත්වය නැතිකිරීමට බැරිනම් දුර්වලකිරීම ය. බ්‍රිතානියෝ වෙල්ලාලයන් මෙරට නායකයන් බවට පත්කළහ. බ්‍රිතානීන් (ඔවුන්ගේ පැත්තෙන්) මෝඩ තක්සේරුවක සිට ලංකාවට සර්වජන ඡන්දය දීමත් සමග මේ තත්වය වෙනස්වීමට ඉඩකඩක් ඇතිවිණි. ඒ බව මුලින් ම තේරුම් ගත්තේ චෙල්වනායගම් ය. ඔහු 1956 ට පෙර 1949 දී ම උතුරු හා නැගෙනහිර පළාත්වල වෙනම රාජ්‍යයක් පිහිටුවීම සඳහා ලංකා දෙමළ රාජ්‍ය පිහිටුවා ගත්තේ ය. තවදුරටත් ඔහු එතෙක් යාපනයේ ඉංගිරිසි කතාකරන දෙමළ ජනයාට පමණක් සීමා වී තිබූ දෙමළ ජාතිවාදය සියළු දෙමළ ජනයා අතරට ගෙනගියේ ය. යථාකාලයේ දී ඉංගිරිසි කතානොකරන දෙමළ ජනයා දෙමළ ජාතිවාදී ව්‍යාපාරයේ නායකයෝ වූහ. ප්‍රභාකරන් එහි නිල නායකත්වයට පත්විය.  අද ප්‍රභාකරන් හා භීෂණය පරාජය කෙරී ඇත. අද උතුරේ හා නැගෙනහිර දෙමළ ජනයාට අවශ්‍ය සංවර්ධනය මිස බලය බෙදීම නො වේ. කරුණා ඇමති ඒ  සංකේතවත් කරයි. බටහිරයන්ට නැවතත් දෙමළ ජාතිවාදය පවත්වාගෙන යෑමට ඉංගිරිසි කතාකරන දෙමළ ජනයා යොදාගැනීමට සිදු වී ඇත. බටහිර රටවල සිංහලත්වයට විරුද්ධ ව්‍යාපාර අද දක්නට ඇත්තේ ඒ හේතුවෙනි. අප කල් ඇතිව කී පරිදි මුහුදින් එතර ඊළමක් පිහිටුවීමේ වෑයමක් වෙයි. පද්මනාදන්ගේ තාවකාලික ඊළාම් ආණ්ඩුව ඒ සැලැස්මෙහි පළමු පියවර වෙයි. එහෙත් දෙමළ ජාතිවාදයට අද ප්‍රශ්න වෙයි. පද්මනාදන් යනු බලවත් පුද්ගලයෙක් නො වේ. ඔහුට සමස්ත දෙමළ ජාතිවාදී ව්‍යාපාරයට නායකත්වය දිය හැකි නො වේ. අද පිටරට දෙමළ ජාතිවාදී නායකත්වය සඳහා සටන් ඇවිළී ඇත. මේ සටන්වලින් පසු ප්‍රභාකරන් මෙන් තනි නායකත්වයක් බිහිවීමට ඉඩක් නැත. දෙමළ ජාතිවාදී ව්‍යාපාරය කැනඩාව ආදී බටහිර රටවල ක්‍රමයෙන් දියවී යෑම ආරම්භ වී ඇත. ලංකාවෙන් පිට වැඩිම දෙමළ ජනකායක් (ලක්‍ෂ තුනක් පමණ) ඇති ටොරොන්ටෝ නගරයේ දෙමළ ජාතිවාදයට විරුද්ධව කතා පැවැත්වීමට මට අවස්ථාව ලැබිණි. (දෙමළ ජාතිවාදීහු ටොරොන්ටෝ මහා විහාරයට මා එහි යෑමට සති දෙකකට පමණ පෙර ගිනි තැබූහ). ඇමරිකාවට අල් ක්වයිඩා ව්‍යාපාරය හේතුවෙන් දෙමළ ජාතිවාදයට සෘජු සහායක් දිය නොහැකි ය. කැනඩාව බ්‍රිතානියට පක්‍ෂපාති වුවත් ඇමරිකාවට පිටින් ක්‍රියා නොකරයි. ප්‍රංශය දෙමළ ජාතිවාදයට අනුග්‍රහ දැක්වුවත් එහි ශක්තිමත් දෙමළ ජාතිවාදී ව්‍යාපාරයක් නැත. දෙමළ ජාතිවාදයට දැන් පැවැත්මක් ඇත්තේ බ්‍රිතානියෙහි පමණ ය. දෙමළ ජාතිවාදය තව ටික කලක් බ්‍රිතානියෙහි පවතිනු ඇත්තේ එරට ආණ්ඩුවේ අනුග්‍රහයෙනි. අප බ්‍රිතානියේ නිරුවත හා ද්‍රෝහීබව හෙළිදරවු කළ යුතු ය.

© Prof. Nalin De Silva